චක්‍රලේඛ අංක - 18 /2017

මගේ අංකය - කේ09/විවිධ/19/2017.

බන්ධනාගාර මූලස්ථානය, කොළඹ 09.

2017.10.09 දින.

සියළුම බන්ධනාගාර අධිකාරී/සහකාර බන්ධනාගාර අධිකාරී වෙත,

<u>ඩෙංගු රෝගය මර්දනය කිරීමේ ජනාධිපති වැඩසටහන.</u>

ඩෙංගු රෝගය මර්දනය කිරීම සඳහා අතිගරු ජනාධිපති තුමාගේ නියමයෙන් හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචිකිරීම් හා හින්දු ආගමික කටයුතු ගරු අමාත්‍යතුමන්ගේ උපදෙස් පරිදි පසුගිය ජූලි මස ඔබ විසින ක්‍රියාත්මක කරනලද වැඩසටහන් පිළිබඳව ස්තූතිය පලකරමින් ජනාධිපති ලේකම් ඔස්ටින් ප්‍රනාන්දු මහත්මා විසින් ලිපියකින් දන්වා එවා ඇත. එකී ලිපියේ සඳහන් පරිදි පසුගිය ජූලි මස ක්‍රියාත්මක කල ඩෙංගු මර්දන වැඩසටහනෙන් රෝග ව්‍යාප්තිය අඩුවීමක් දක්නට ඇතත්, එය සැලකිය යුතු මට්ටමකට පැමිණ නැති බැවින් හා වර්ෂා කාලය පැමිණීමත් සමඟම නැවත රෝගය ව්‍යාප්ත වීමට ඉඩකඩ ඇති නිසා එම පිරිසිදු කිරීම් 2017 දෙසැම්බර් මස 31 දක්වා ක්‍රියාත්මක කලයුතු බව දන්වා ඇත.

එබැවින් බන්ධනාගාර නිලධාරීන්ගේ හා නේවාසිකයන්ගේ සෞඛ්‍යාරක්ෂක ක්‍රමවේදයන් අනුගමනය කරමින් පිටත අනුමත නේවාසිකයන් යොදවා ඩෙංගු ව්‍යාප්ත වන ප්‍රදේශ පවිත්‍ර කිරීමට ක්‍රියාකල යුතුවේ. ඊට අදාලව පහත සඳහන් ක්‍රියාමාර්ගයන් ඔබ විසින් අනුගමනය කලයුතු බව දැනුම් දෙමි.

1/සෑම සිකුරාදා දිනකම පැයක පමණ කාලයක් ආයතනය (නිලනිවාස/අවිවාහක නිලනිවාස) අවට පරිශ්‍රයන් පිරිසිදුකිරීමට කටයුතු කිරීම.

2/ඔබ ප්‍රදේශයේ දිස්ත්‍රික් ලේකම්, ප්‍රාදේශීය ලේකම්, දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරී කාර්යාල සමඟ සාකච්ඡාකර ඩෙංගු මදුරුවන් බෝවන ස්ථාන පිළිබඳව තොරතුරු ලබා ගන්න.

3/එකී ස්ථානයන් සඳහා නේවාසිකයන් යෙදවීමට (අවදානම් සහිත) සුදුසු ස්ථානයක්ද යන්න පිළිබඳව ජේලර්වරයකු හෝ පුනරුත්ථාපන නිලධාරී වරයකු යොදවා වාර්තා ලබා ගෙන එම වාර්තාව හා ඔබගේ නිර්දේශය සමඟින් අවස්ථාව ඇති පරිදි මූලස්ථානයේ අනුමැතිය සඳහා යොමු කරන්න.

4/වැඩසටහන අවසන් වන 2017.12.31 දිනෙන් පසු අදාල ශ්‍රමදාන වල ප්‍රගතිය සඳහන් විස්තර වාර්තාවක් මූලස්ථානය වෙත යොමුකරන්න.

මෙකී කාලය තුලදී මෙය ජාතික අවශ්‍යතාවයක් ලෙස සලකා ඔබගේ පෞද්ගලික අවධානය යොමුකර මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට පියවර ගන්න.

එච්.එම්.එන්.සී.ධනසිංහ

බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

එච්.එම්.එන්.සී. ධනසිංහ
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ - 09.